00025

සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

## ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ/ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය -2018 (I)

| කාලය - පැය 03 | පරිපාලනය (2-III) | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.............................. |
|---|---|---|

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

01. i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති අනුව රජයේ නිලධරයන් පත්කිරීම කෙරෙහි බලපාන කොන්දේසි හා නියමයන් දහයක් (10) සඳහන් කරන්න. (ලකුණු 10)

    ii. රාජ්‍ය සේවාවේ බඳවා ගැනීමේ පටිපාටියක ඇතුලත්විය යුතු කරුණු මොනවාද? එම පටිපාටිය අනුමත කළ යුත්තේ කවුරුන් විසින්ද? (ලකුණු 10)

02. i. රාජ්‍ය සේවයට නිලධාරියකු පත්කිරීමෙන් පසු ඔහු වෙනුවෙන් පවත්වාගෙන යන පෞද්ගලික ලිපිගොනුවට අනිවාර්යයෙන්ම ඇතුලත් කළ යුතු ලේඛන දහයක් (10) නම් කරන්න. (ලකුණු 10)

    ii. තනතුරක වැඩබැලීම සඳහා පත්කිරීමට අදාල කොන්දේසි මොනවාද? (ලකුණු 10)

03. i. රජයේ නිලධරයෙකු වෙත සේවා සහතිකයක් නිකුත් කළ හැක්කේ කුමන අවස්ථාවලදී ද යන්න සඳහන් කර එවැනි සේවා සහතිකයක ඇතුලත්විය යුතු කරුණු පහක් (05) ලියන්න. (ලකුණු 10)

    ii. එම සේවා සහතිකය නිකුත් කළ යුත්තේ කා විසින්ද යන්න පැහැදිලි කර එසේ නිකුත් කිරීමේදී සැලකිය යුතු කරුණු සටහන් කරන්න. (ලකුණු 10)

04. i. රාජ්‍ය සේවාවේ මූලික විමර්ශන නිලධාරියකු විසින් කළ යුතු ප්‍රධාන කාර්යයන් තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 10)

    ii. මූලික විමර්ශන වාර්තාවක ඇතුලත් කළ යුතු ප්‍රධාන කරුණු පහක් (05) ලියන්න. (ලකුණු 10)

05. i. චෝදනා පත්‍රයක අනිවාර්යයෙන්ම ඇතුලත් විය යුතු කරුණු දහයක් (10) ලියන්න. (ලකුණු 10)

    ii. චෝදනාපත්‍ර සංශෝධනයට අදාල කොන්දේසි මොනවාද? (ලකුණු 10)

06. i. රාජ්‍ය සේවාවේ අධිකාරී බලය යන්නෙන් අදහස් කරන්නේ කුමන කාර්යයන් පහට (05) අදාල අධිකාරී බලයද යන්න සඳහන් කර වර්තමාන ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවාවේ එම අධිකාරී බලය හිමි ව්‍යවස්ථාපිත ආයතන නම් කරන්න. (ලකුණු 10)

    ii. එම ආයතන මේ වනවිට එම අධිකාරී බලය අභිනියෝජනය (Delegation) කර ඇති ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)



ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
03 JUL 2020
පුස්තකාලය

07. පහත සඳහන් කරුණු හතරක් (04) පිළිබඳව කෙටිසටහන් ලියන්න.

i. සේවය අවසන් කිරීම

ii. තනතුර අතහැරයාම

iii. පරිවාස කාලය

iv. රාජ්‍ය සේවාවේ අධිකාරී බලය

v. ඒකවරණ නිලධාරී

(ලකුණු 05X4=20)

**********

03 JUL 2020